14 වන පිටුවෙන් (අදිසි)

"තේ එකක් වත් බොමුද දරුවො..?" සමදරා අසයි.

"එපා නෝනා.. පරක්කු වෙනවනෙ.. ඇමති තුමා තුන් සැරයක්ම කෝල් කළා ඉක්මන් කරන්ඩ කියලා"

"මං එනකල් ඇහැරගෙන ඉන්න එපා.. අම්මා නිදාගන්න.." ජයන්ත විසින් ඇර දෙනු ලබන පිටුපස දොරින් රිංගා වාහනයට ගොඩ වන අතර අයෝමා කියයි.

අයෝමා විසින් විසුළන ලද විළවුන් සුවඳ වාහනය පිටව ගිය පසුව ද සමදරාට දැනෙයි. බොහෝ කලකට පෙර අයෝමා සිටවූ සේපාලිකා මල් වැලෙන් හමා ආවේද මෙවන් සුවඳක්ම නොවේදැයි ඇයට සිතෙයි. නිතර නිතර පැමිණෙන වාහන හැරවීම සඳහා ඉඩ කඩ ලබා ගැනීමට අජිත් ඒ මල් වැල කපා දැමුවේ මෙයට මාසයකට පමණ පෙරදී ය.

**"අම්මපා අපේ පොඩි හාමුදුරුවනේ ලොකු හාමුදරුවන්ට සුවිප් එකක් වත් ඇදුනයි...?" සෙදෝරිස් අසන්නේ විමතිය නිසාම නොවේ. එහෙන් මෙහෙන් අසුලා ගත් තොරතුරු සියල්ල පිලිවෙළකට අමුණා ගන්නට පොඩි හාමුදුරුවන්ගේ සහයෝගය ඔහුට අවශ්‍යව ඇත. උන්වහන්සේ ගෙන් වචනයක් ගැනීම ඉබ්බාගෙන් පට්ටයක් ගැනීමට වඩා අසීරු බව ඔහු නොදන්නවා නොවේ. "**



"අපරාදෙ.." සමදරා සිතයි.

000000

මහ හඬ නගමින් පැරණි තාප්පය පෙරළෙන්නේ දූවිලි වලාවක් පරිසරයට එක් කරමින් ය. මකර තොරණින් දකුණු පස බැමි කොටස දැනටමත් අලුතින් බඳින්නට පටන් ගෙන ඇත. පෙදරේරුවන් හා කම්කරුවන් ගඩොලින් ගඩොල තාප්පය ගොඩ නගන වේගය දෙස බලා සිටින විට දින දෙක තුනකින් සියල්ල නිම වනු ඇති බවට විශ්වාසයක් සෙදෝරිස් තුළ ඇති වෙයි. දන්නා කාලයේ සිට ගරා වැටෙමින් තිබූ මේ තාප්පය අලුතින් ගොඩ නගන්නට මේ තරම් හදිසියක් එක වර පහළ වූයේ මන්දැයි ඔහුට නොවැටහෙයි.

ලොකු හාමුදුරුවන් වරක් දෙවරක් පැමිණ ගොඩ නැගෙන තාප්පය දෙස ඈත සිට බලා සිට හිස් මුදුන අතගාමින් නැවත ආවාස ගෙයට යන්නේ මහා බරක් හිස මත තබාගත්තාක් වැනි බැල්මක් මුහුණේ ඇඳ ගෙන ය.

"අම්මපා අපේ පොඩි හාමුදුරුවනේ ලොකු හාමුදරුවන්ට සුවිප් එකක් වත් ඇදුනයි...?" සෙදෝරිස් අසන්නේ විමතිය නිසාම නොවේ. එහෙන් මෙහෙන් අසුලා ගත් තොරතුරු සියල්ල පිලිවෙළකට අමුණා ගන්නට පොඩි හාමුදුරුවන්ගේ සහයෝගය ඔහුට අවශ්‍යව ඇත. උන්වහන්සේ ගෙන් වචනයක් ගැනීම ඉබ්බාගෙන් පට්ටයක් ගැනීමට වඩා අසීරු බව ඔහු නොදන්නවා නොවේ. ".. මං බලාන දායක සබාවෙ සබාපති උන්නැහෙත් උදෙන්ම ඇවිත් ලොකු හාමුදුරුවන් එක්ක මොනාද සුටු සුටු ගානවා.. උන්නැහේලත් කල්පනා කරනවා ඇති මේ දන්න කාලෙ ඉඳන්ම ගරා වැටෙමින් තිබ්බ තාප්පෙ මේ තරං ඉක්මනට හදන්න සල්ලි කොයින්ද කියලා.. මං කිව්වෙ ඕන කෙනෙකුට එහෙම හිතෙනවනෙ අපේ හාමුදුරුවනේ..."

සෙදෝරිස් පොඩි හාමුදුරුවන් මුහුණ බලා කතාව මොහොතකට නවත්වයි. පොඩි හාමුදුරුවෝ තවමත් නෑසූ කන්ව බලා සිටිති. සුළඟින් තැඹිලි අතු සෙළවෙන සිලි සිලි හඬ හොඳින් ඇසෙයි. බණ මඩුවේ වහලයේ ගෙවල් තනා ගත් ගේ කුරුල්ලන්ගේ කිචි බිචිය ද නොනැවතෙයි.

"මං ඒත් බාස්ලගෙනුත් ඇහුව.. උන්නැහේල නම් කියන්නෙ මේක මේ අපේ මන්තිරි තුමාගෙන් පන්සලට තෑග්ගක් කියලයි.. හැබෑවක්ද අපේ හාමුදුරුවනේ..? මේ තරං තෑග්ගක් දෙන්ඩ රණසිංහ මහත්තයට උන් හිටි ගමන් හිතිච්ච එකනෙ අරුමෙ.."

"කෙනෙක් සද්භාවයෙන් යමක් පූජා කළා නම් අපි ඒක බාර ගන්න ඕනෙනෙ සෙදෝරිස්.."

සෙදෝරිස් ගේ මුහුණේ ඇඳෙන්නේ උපහාසාත්මක සිනාවකි. පොඩි හාමුදුරුවෝ ඒ නොදුටුවා සේ සිටින්නට වෑයම් කරති.

"සද්බාවෙං කොයි හැටි වෙතත් රණසිංහ මහත්තයා එකක් කරන්නෙ දෙකක් බලාපොරොත්තුවෙන්.. අපි නොදන්නවැයි උන්නැහේගෙ හැටි..? උන්නැහේ පූජාවල් දන්නෙ නැහැ අපේ හාමුදුරුවනේ .. උන්නැහේ දන්නෙ ගනු දෙනු.. ගනු දෙනු..."

දෑත් බැඳගෙන සීරුවෙන් සිටගෙන සිටින පොඩි හාමුදුරුවන්ගේ මුහුණේ කිසිදු හැඟීමක් නොපෙනෙයි. ඔහුගේ ඇස් යොමුව ඇත්තේ කැඩුණ තාප්යෙන් නිරාවරණය වූ මහා මාර්ගය දෙසට ය.

"කෙනෙක්ගෙන් යමක් ගත්තා නම් ආපහු යමක් දෙන්ටත් වෙනවා සෙදෝරිස්.." උන්වහන්සේ පවසන්නේ හිටි ඉරියව්ව බිඳකුදු වෙනස් නොකරමින් ය.

"දෙන්නෙ මොනාද..?"

"දෙන්නෙ මොනාද කියන එක නෙවෙයි ප්‍රශ්නෙ.. ඕනෙ මොනාද කියන එක"

0000000

"මට හැම දේම එපා වෙලා තියෙන්නෙ අයියෙ.." අයේෂා ගේ දෑසේ කඳුළු පිරී තිබෙනු සුනන්දට පෙනෙයි. මන්ත්‍රී කාර්යාලය අසාමාන්‍ය ලෙස  නිහඬ බවක් උසුළයි. පෙරදා රැයේ පැවති මහා රැස්වීමෙන් පසු සියල්ලන්ම විවේක ගත්තාක් වැනි ය.

"කෝ මේ මිනිස්සු..?" සුනන්ද අසන්නේ අයේෂා ගේ බස නෑසුණා සේ ය.

"හවස් වෙනකොට පිරෙයි.. දැන් මෙතන ඉන්නෙ ඔක්කොම අවස්ථාවාදී බඩගෙ ්ස්තරවාදියො රැළක්.. එකෙක් වත් ලොක්කට හැබෑවට ලෙන්ගතු අය නෙවෙයි... දැන් අපේ ලොක්කටත් උන් තමයි ලොකු.." සුනන්ද යමක් කියනු ඇත යන බලාපොරොත්තුවෙන් අයේෂා කතාව නවතා ඔහු දෙස බලයි. ".. මටත් වැඩි කාලයක් ඉන්න බැරි වෙයි අයියෙ.."

සුනන්ද ඇය දෙස බලයි. වචනයෙන් නෑසුවද ඔහුගේ මුහුණේ ඇඳී ඇති ප්‍රශ්නාර්ථය ඇයට වැටහෙයි.

"කරුණු සිද්ද වෙන හැටියට මටත් ඉක්කමනටම යන්න වෙනවා මෙතනින්.. විස්තර අහන්න එපා.. අයියටවත් හැම දේම කියන්න මට බැහැ.." අයේෂා අත් බෑගයෙන් ගත් ලේන්සුවකින් කඳුලු පිසගනියි. පෙර දිනෙක දුටුවාටත් වඩා කෘෂව මළානිකව ගිය පෙනුමක් ඈ වෙතින් දිස් වේ යයි සුනන්දට සිතෙයි. පෙරදී ඈ කෙතරම් කෙළිලොල්ව සිටියා ද?

සුනන්ද කාර්යාලයෙන් පිට වන්නේ කල්පනාවෙන් බර වූ සිතින් ය. මේ වෙනස් කම් පිලිබඳව මුලදී තිබූ තරම් කැළඹීමක් දැන් ඔහුට නොදැනෙයි. බාහිර නිරීක්ෂකයකු ලෙස මේ සියල්ල දෙස බලා සිටිනවා විනා එහි පාර්ශවකරුවකු වන්නට තමාට නොහැකි බව සුනන්ද පසක් කරගෙන ඇත. එක අතකින් ඒ වියුත්ක වීම සිතට සහනයකි. මහා බරක් බිම තැබුවාක් වැනි සැහැල්ලුවක් දැනෙයි.

කාර්යාලයෙන් පිටවන සුනන්ද කොන්ක්‍රීට් අඩිපාර දිගේ බංගලාව කරා ඇවිද එයි. ටික දිනකින් නිසි සාත්තුවක් නොලද තණ බිම අයාලේ වැඩී අඩිපාර ආක්‍රමණය කරන්නට සැරී සිටියි. සුනන්ද බංගලාවේ පඩි පෙළ පාමුළ නැවතී හිස ඔසවා බලයි. මේ පඩි කීපය මේ තරම් උස යයි පෙරදී නොදැනුණේ මන්ද යන විමතිය සැණින් ඔහු සිත පුරා පැතිර යයි.

"සුනන්දයියා..." වින්ධ්‍යා ගේ ගීතවත් කටහඬ ඔහු දැහැන බිඳ දමයි. ".. ඇයි මේ පුදුමෙන් වගේ බලාගෙන ඉන්නෙ.. එන්න.." ඇගෙ මන්දහාසය අව්‍යාජය. ඒ අව්‍යාජ බව සිතේ අඳුර මොහොතින් නසා දමයි.

"මං හිතුව අද ඔයා එයි කියල .. එන්න ඇතුළට.." ඈ දෑසින් සිනාසෙයි. මේ අප්‍රාණික පරිසරයේ ජීවත් වන එකම සත්වයා ඇය නොවේද? දවසේ පළමු වතාවට ඔහු මුව සිනාවක් ඇඳී යයි. පඩිපෙළ නැග වින්ධ්‍යා අසළට යන ඔහුට ඇගේ සුවඳ දැනෙයි.

ඒ සුවඳ අපූරුය.

ළබන කළාපයට

# කමල් සහ යශෝධරා සමඟින් වසන්තයේ රාවය

වසන්තය මිහිරිය. සුන්දරය. ඒ මිහිරි සුන්දර වසන්ත කාලය ගැන සිහිවන විට අපට නිතැතින්ම මතකයට එන්නේ සිරිලක අවුරුදු සුවඳයි. කොවුලාත් එරබදු මලත් සිහිනෙන් දකින අපි මෙරට සිට ඒ අවුරුදු අසිරිය විඳගන්නට දරණ අපමණ වෙහෙසෙන් එක් කොටසක් වෙන්වන්නේ බක්මහ අවුරුදු උත්සව සහ නර්තන රංගන ගායනා වෙනුවෙනි. බක්මහ රංගන ප්‍රසංගය ඒ වෙනුවෙන්ම බිහිවූ අපේ මහා කලා මංගල්‍යයයි. කවදත් ශ්‍රී ලංකාවේ සිට පැමිණෙන ප්‍රවීන ආරාධිත කලා ශිල්පීන් සමඟින් මෙපුර වසන අපේම පිරිපුන් කලා ශිල්පීන් එක්ව ඉදිරිපත් කරන බක්මහ ප්‍රසංගය කාගේත් මනදොල පුරවන සිත් සතන් පහන් කරන ආකර්ෂණීය ප්‍රසංගයක් වේ. මෙවර එම බක්මහ රංගන 2009 ප්‍රසංගය නම් කර ඇත්තේ "වසත් රාවය" නමින් ය.

කමල් අද්දරආරච්චි අපිට ආගන්තුක කලාකරුවකු නොවේ. ඔහු 80 දශකයේ සිට වේදිකාව, සිනමාව, පුංචි තිරය තරණය කරමින් අපූරු දස්කම් පෙළහරක් පෑ ප්‍රේක්ෂක ආදරය දිනාගත් සම්මානනීය කලාකරුවෙකි. ගාමිණී ෆොන්සේකා නිර්මාණය කළ සාගරයක් මැද චිත්‍රපටිය තුළින් සිනමාවට ආ කමල් වේදිකා නාට්‍යය මෙන්ම ටෙලි නාට්‍යය රාශියකම විවිධ චරිත නිරූපණය කරමින් 90 දශකය වන විට ලාංකික කලාව තුළ ප්‍රතිභාපූර්ණ සළකුණක් බවට පත්විය. රතුරෝස, හිරුට මුවාවෙන්, රන් කහවනු, දඬුබස්නාමානය ආදී ටෙලි නාට්‍ය තුළින් අපූරු රංගනයක යෙදුනු කමල් සප්ත කන්‍යා චිත්‍රපටියේ ප්‍රධාන චරිතයට පණ පොවමින්ද, එහි උන්මාද වූ ප්‍රේමාදරේ ගීය ගායනා කරමින්ද එම වසරේ හොඳම ගායකයාට හිමි ජනාධිපති සම්මානයද හිමිකරගත්තේය. ඔහු ජනප්‍රිය නළුවාට හිමි සම්මානය සරසවි සම්මානය ඇතුළු සුමති සම්මාන ජනාධිපති සම්මාන රාශියක් දිනාගත් ආකර්ෂණීය රංගන ශිල්පියෙකි.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ දියණියක වන යශෝධරා පියාගේ සහ මවගේ ආභාෂයෙන් රඟමඬල ජයගත් ප්‍රතිභාපූර්ණ වේදිකා නාට්‍ය ශිල්පිනියකි. මෑතක් වනතුරුම මනමේ, සිංහබාහු වැනි නාට්‍යවල ප්‍රධාන චරිතය නිරූපණය කළ ඇය දැන් දිවි ගෙවන්නේ මෙල්බන් නුවරය. මෙපුර ශ්‍රී ලාංකික දරුදැරියන්ට තම කලාත්මක කුසලතාවයන් බෙදා දෙන ඇය නාට්‍ය වැඩමුළු හා දේශන පවත්වමින් එම දරුවන්ගේ කලාත්මක හැකියාවන් ඔපමට්ටම් කරගැනීමට දරණ වෙහෙස ප්‍රශංසනීයයි. මෑතකදී එවැනිම කලා කුසලතාවයකින් සපිරි තම සැමියා වන කුසුම්සිරි ලියනාරච්චි සමඟ එක්ව "දඟයා සහ මුත්තගෙ විත්ති" නමින් ඉතාමත් උසස් මට්ටමේ ළමා නාට්‍ය නිර්මාණයක් වේදීකාවට ගෙන ආ ඇය මේ දිනවල සරච්චන්ද්‍රයන්ගේ පැරණි ප්‍රහසන නාට්‍ය කිහිපයක් වේදිකාවට ගෙන ඒමට සැලසුම් කරගෙන සිටී. මෙවැනි ප්‍රතිභාපූර්ණ රංගධර සුසංයෝගයක් ආරාධිත ශිල්පීන් ලෙස, වසත්රාව-බක්මහ රංගන 2009ට ආරාධනා ලැබ ඔබ හමුවට එන අතර, සිඩ්නි නුවර අප සමඟ වාසය කරන ප්‍රවීන ටෙලිනාට්‍ය රංගන ශිල්පිනියක් වන ඕෂනී ඩයස් ගේ රැඟුම්වලින් ද වසත්රාව ඔපවත් වේ. නාලන් මෙන්දිස්ගේ  සෙනෙහසට ආදරෙයි ටෙලි නාට්‍යයෙහි ප්‍රධාන චරිතයට පණ පොවමින් ප්‍රේක්ෂක හද වැළඳගත් ඕෂනී ලාබයි ඇපල්, පෙති අහුලන මල්, ලන්සු තියෙන මල්, ආදී ජනප්‍රිය ටෙලිනාට්‍යවල රඟ පෑ දක්ෂ ටෙලි නාට්‍ය නිළියක් වේ.

සිඩ්නි නුවර වාසය කරන කලා ශිල්පීන් රාශියක් පිරිවරා ගෙන මෙවර නිව් සවුත් වේල්ස් සිංහල සංස්කෘතික හමුව ඉදිරිපත් කරන බක්මහ රංගන ප්‍රසංගය මාලා අබේවික්‍රම, දිනේෂ් පෙරේරා, රාජිණී ෆොන්සේකා යන  දක්ෂ නර්තන ගුරුවරුන්ගේ සිසු සිසුවියන් ඉදිරිපත් කරන නර්තන රැඟුම්වලින්ද අලංකාරවත් වේ.

පුංචිතිරය, වේදීකාව, සිනමාව එකට යාවෙන වසන්ත රාවය, නැරඹීමට සිඩ්නි නුවර සංස්ථ ාපිත සිංහල සංස්කෘතික හමුව ඔබ සැමට සිංහල අවුරුදු ආසිරි පතමින් හදපිරි බැතියෙන් ආරාධනා කරයි. මැයි මස 02 සෙනසුරාදා සවස 6.30 ට කාසල් හිල් හි "හිල් සෙන්ටර්" හිදී මෙය ප්‍රසාංගික වන අතර ඒ පිළිබඳ වැඩි විස්තර දැන ගැනීමට පහත සඳහන් අංක අමතන්න.

දයා - 98947334, ලලිත් - 94814584, පරාක්‍රම - 0407332925

ලක්ෂමන් කොඩිතුවක්කු